# ශ්‍රී ලංකාවේ කෘෂි සංවර්ධනයට ඵලදායිව දායකවීම.

## 01.පාඩම

# 1.ශ්‍රී ලංකාවේ කෘෂි සංවර්ධනයට එලදායිව දායකවීම.

දළ දේශීය නිෂ්පාදනය යනු කිසියම් රටක කිසියම් වර්ෂයකදී නිපදවන සියළුම භාණ්ඩ හා සේවාවල මුළු වටිනකමයි. එයට දායක වන ප්‍රධාන අංශ.

සේවා > කර්මාන්ත > කෘෂිකර්මය

### දළ ජාතික නිෂ්පාදිතය යනු,

කිසියම් රටක වෙසෙන ජනයා වසරක් තුළදී නිපදවන නිමි භාණ්ඩ හා සේවාවල වටිනාකමයි. (විදේශ ආයෝජන අයත් නොවේ. නමුත් ශ්‍රී ලාංකිකයන් විදේශයට ගොස් උපයන මුදල් අයත්ය.)

### දළ ජාතික නිෂ්පාදිතයට කෘෂි අංශ දායකවන ක්ෂේත්‍ර,

2014 සංඛ්‍යා ලේඛන අනුව,

| | |
|---|---|
| කෘෂිකර්මය | - 10.1% |
| කර්මන්ත | - 32.3% |
| සේවා | - 57.6% |

1. බෝග නිෂ්පාදන - වී, තේ, රබර්, පොල්
2. සත්ව නිෂ්පාදන - කිරි, බිත්තර, මස්
3. ධීවර නිෂ්පදන - මිරිදිය මාළු, මුහුදු මාළු
4. වන සම්පත් - 25% දක්වා වන සම්පත ආවරණය වී ඇත.

### කෘෂි අංශයේ රැකියා නියුක්තිය

සේවා > කර්මාන්ත > කෘෂිකර්මය

### <u>කෘෂිකර්මය ආශ්‍රිත කර්මාන්ත</u>

1. ආහාර - සහල් සැකසීම, බිස්කට්, පන්, යෝගට්
2. කෘෂිකාර්මික යෙදවුම් නිපදවීම - පොහොර, යන්ත්‍ර, කෘෂි රසයනික ද්‍රව්‍ය
3. කෘෂිකාර්මික ඉදිකිරීම් - ගොවිපොළ ගොඩනැගිලි, සත්ව නිවාස, වැව් හා වාරි මාර්ග
4. සත්ව ආහාර නිෂ්පාදනය - බ්‍රොයිලර් සතුන්ගේ ආහාර, කිකිළියන්ගේ ආහාර

## කෘෂිකර්මය ආශ්‍රිත සේවා

I. කෘෂිකාර්මික උපදේශන සේවා.
II. කෘෂිකාර්මික පර්යේෂණ
III. ප්‍රවාහන සේවා
IV. නඩත්තු සේවා
V. කෘෂිකාර්මික ණය හා රක්ෂණ සේවය
VI. කෘෂි භාණ්ඩ අලෙවිය
VII. පුහුණු ශ්‍රමය සැපයීම.

## ස්වයං පෝෂිත ආර්ථිකයක් පැවති බවට සාකෂි

පරාක්‍රමබාහු රජු සමයේ සහල් පිටරට යැවීම, දියුණු දේශීය වෛද්‍ය ක්‍රමය, දුර්භික්ෂ වලදී ප්‍රමණවත් ආහාර තිබීම.

- කෘෂිකාර්මික සශ්‍රීකත්වයට තුඩුදුන් හේතු,
  - ✓ වාරිකර්මාන්තය
  - ✓ රාජ්‍ය අනුග්‍රහය
  - ✓ සංස්කෘතික හා ආගමික පසුබිම

- ගොවි ජනපද හා බහුකාර්ය යෝජනා ක්‍රම - ප්‍රථම යෝජනා ක්‍රමය - ගලඔය, විශාලම යෝජනා ක්‍රමය - මහවැලි , උඩවලව ඉගිනිමිටිය වැනි යෝජනා ක්‍රමද ඇත.
- හරිත විප්ලවය - නව ප්‍රභේද නිෂ්පාදනය, යාන්ත්‍රකරණය හා අධික යෙදවුම් භාවිතය තුළින් ඒකක භූමියක ඵලදාව ඉහළ දැමීමයි. මෙහි හිතකර මෙන්ම අහිතකර බලපෑම්ද ඇත.

## නූතන කෘෂිකාර්මික අභියෝග හා ඒවා ජයගත හැකි මාර්ග.

| අභියෝග | ජයගත හැකි මාර්ග |
|---|---|
| ආහාර ද්‍රව්‍ය ආනයනයේදී ගිවිසුම් වලට යටත් වීමට සිදු වීම. | ආනයනය අඩුකර දේශීයව භාණ්ඩ නිෂ්පාදනය කිරීම. |
| පසුගාමී තාක්ෂණය | නව තාක්ෂණය හඳුන්වා දීම. |
| උපරිම අස්වනු විභවය කරා ළගා නොවීම. | උපරිම අස්වනු විභවය කරා ළගා වීම සඳහා වැඩි දියුණු කල ප්‍රභේද යොදා ගැනීම. |
| කෘෂිකර්මය ආශ්‍රිත කෘෂි ව්‍යවසායකත්ව හිගය. | දැනට සිටින ව්‍යවසායකයන් දිරිමත් කිරීම තුලින් නව ව්‍යවසායකයන් නැඹුරු කර ගැනීම. |
| අහිතකර දේශගුණික බලපෑම් | අහිතකර දේශගුණික තත්ව වලට ඔරොත්තු දෙන බෝග සිටු වීම. |
| ජාන කිටුව ක්ෂය වී යාම. | දේශීය ජාන කිටුව වැඩිදියුණු කිරීම. |

## කෘෂිකර්මයෙහි අනාගත ප්‍රවණතා සහ කෘෂි සංවර්ධනයට ඒවායේ භාවිත

I. ඉඩම්වල උපයෝගීතාව වැඩි කිරීම.
II. ශ්‍රම බලකායේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම.
III. දේශගුණික සාධක ප්‍රශස්ත ලෙස පාලනයට උත්සහ දැරීම.
IV. රටේ ආහාර සුරක්ෂිතතාව ඇති කිරීම.

- ජාතික කෘෂිකර්ම ප්‍රතිපත්තියක් යනු කෘෂිකර්ම දියුණු කර ගැනීම සඳහා ඇතිකර ගන්නා වූ සම්මතයන් ය. විවිධ ක්ෂේත්‍ර සඳහා වෙන වෙනම ප්‍රතිපත්ති සකසා ඇත.
  I. වාරි මාර්ග ප්‍රතිපත්තිය
  II. ශාක නිරෝදාන ප්‍රතිපත්තිය
  III. නිෂ්පාදනිය, වෙළඳාම හා පාරිභෝජනය සම්බන්ධ ප්‍රතිපත්ති.
  IV. ඉඩම් ප්‍රතිපත්ති.
  V. රසායනික ද්‍රව්‍ය භාවිතය සම්බන්ධ ප්‍රතිපත්ති.

## කෘෂිකර්මයට අදාළ පනත්

- මේවා පාර්ලිමේන්තුවේදී සම්මත කර ගන්නා වූ නීතිමය නියෝගයන් ය. විවිධ ක්ෂේත්‍ර සඳහා පනත් සකසා ඇත.

## ගොවිජන සංවර්ධන පනත (2000 අංක 46 දරන ගොවි ජන සවර්ධන පනත)

| |
|---|
| අද ගොවීන්ට කුඹුරු ඉඩම්වල තම අයිතිවාසිකම් ආපසු පැවැරීමටද අවස්ථාව සැලසුණි. කුඹුරු ඉඩම් අනවසරයෙන් වෙනත් කර්යයන් සඳහා භාවිත කිරීම වැළැක්වීමට බලය පවරන ලදි. |

- **2003 අංක 23 ධරන බීජ සහතික කිරීමේ පනත.**
- **ජල කළමනාකරණ පනත.**
- **පළෑටි සංරක්ෂණ පනත.**
- **පාරිසරික පනත.**
- **පාංශු සංරක්ෂණ පනත.**

---

- **පළෑටි සංරක්ෂණ පනත.**
- **නිරෝධායන පනත.**
- **පාංශු සංරක්ෂණ පනත.**
- **පළිබෝධ නාශක පනත.**
- **2003 අංක 23 ධරන බීජ සහතික කිරීමේ පනත.**

} කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

## කෘෂි සංවර්ධනයට වැදගත් වන විවිධ ආයතන

### රාජ්‍ය ආයතන

පර්යේෂණ ආයතන :- උද්‍යාන බෝග - ගන්නෝරුව, ක්ෂේත්‍ර බෝග - මහඉලුප්පල්ලම

| වී | රබර් | තේ | කුරුඳු | උක් | පොල් |
|---|---|---|---|---|---|
| බතලගොඩ, ලබුදූව, අම්බලන්තොට | අගලවත්ත | තලවාකැලේ | කඹුරුපිටිය | උඩවලව | ලුණුවිල |

- ව්‍යාප්ති සේවය සම්බන්ධ ආයතන - කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, මහවැලි අධිකාරිය.
- යෙදවුම් සම්බන්ධ ආයතන - වාරි මාර්ග දෙපාර්තමේන්තුව. (ජලය)
- අළෙවිය සම්බන්ධ ආයතන - පශු සම්පත් මණ්ඩලය, තේ මණ්ඩලය.

✓ **පෞද්ගලික ආයතන** - සී. අයි. සී. සමාගම, හේලීස් සමාගම, බවර් සමාගම
✓ **රාජ්‍ය නොවන සංවිධාන** - world vision, seedo sri lanka, සර්වෝදය
✓ **ගොවි සංවිධාන** - මහවැලි සංවිධාන
✓ **ණය සහ සහනාධාර සඳහා ඇති මූල්‍ය ආයතන** - සෙලාන් බැංකුව (ණය ලබා දීම)
✓ **අධ්‍යාපන ආයතන** - විශ්ව විද්‍යාල, කෘෂිකර්ම විද්‍යාල, පාසල්

### කෘෂි සංවර්ධනයට වැදගත් වන විවිධ රාජ්‍ය ආයතන වල කාර්යයන්

- කෘෂිකර්ම දෙපාර්තමේන්තුව - කෘෂිකාර්මික පර්යේෂණ මෙහෙයවීම, බෝග වගා සැලසුම්කරණය, ගොවීන්ට උපදෙස් ලබා දීම. නව තාක්ෂණය ප්‍රචලිත කිරීම ආදිය / ගොවීන් සඳහා පුහුණු පන්ති පැවැත්වීම. (පේරාදෙණිය, වයඹ, රජරට, රුහුණ, ඌව වෙල්ලස්ස, සබරගමුව ආදී විශ්ව විද්‍යාලවල කෘෂිකර්ම උපාධිය හැදෑරිය හැකිය.) / පලිබෝධ නාශක පනත, පාංශු සරක්ෂණ පනත ආදී පනත් ක්‍රියාත්මක කිරීම.
- අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව - පර්යේෂණ කටයුතු සිදු කිරීම, නව විභවයන් හඳුනාගැනීම.
- ගොවිජන සේවා දෙපාර්තමේන්තුව - කෘෂි යෙදවුම් සහ සේවාවන් සපයා දීම, ගොවිජන බැංකුව මගින් කෘෂි ණය ලබා දීම, ගොවි ගැටළු විසඳීම, කන්න රැස්වීම් පැවැත්වීම, ගොවි සංවිධාන පිහිට වීම අක්කර බදු අය කිරීම ආදිය.
- පොල් වගා කිරීමේ මණ්ඩලය - රෝපණ ද්‍රව්‍ය සහ උපදෙස් ලබා දීම.

# Written by

# Student of University of Ruhuna

# Faculty of Technology